# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2016 පෙබරවාරි මස 09 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන සමුපකාර, සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම් වතු යටිතල පහසුකම් කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/77)

අ. බස්නාහිර පළාත් සමුපකාර අමාත්‍යංශය විසින් 2011 වසරේදි රුපියල් ලක්ෂ පනස් අටක් (රු.5800000/-) වියදම් කර බොරලැස්ගමුව එගොඩවත්ත ප්‍රදේශයේ සමුපකාර ගොවනැගිල්ලක් වසර 4ක් තිස්සේ ඉදිකරමින් තිබේද?

ආ. මෙම ඉදිකිරීම අතරමග නවතා දැමීමට හේතුව කුමක්ද?

ඇ. මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය ඉතිරි මුදල කොපමණද?

ඈ. එම ඉතිරි මුදල ලබා දෙන්නේ කවදාද?

ඉ. සමුපකාර ප්‍රාදේශික ගොවනැගිල්ලක් ඉදිකිරීමට මෙවැනි මුදලක් වියදම් කර ඇත්තේ බස්නාහිර පළාතේ සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක බව ඔබතුමා දන්නවාද?

ඊ. මෙවැනි නාගරික ප්‍රදේශයක සමුපකාර ප්‍රාදේශිකයක් පිහිටුවීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකියැයි ඔබතුමා විශ්වාස කරන්නේද?

**02.** ගරු ලලිත් වර්ණකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යොවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016.01.19 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) /16/02)

අ. හොරණ අධ්‍යාපන කලාපයේ බුලත්සිංහල කොට්ඨාශයේ 'පහල නාරගල ශ්‍රී සාරානන්ද ප්‍රථමික විද්‍යාලය' නම් පාසලක් තිබෙන බව ඔබතුමා දන්නෙහිද?

ආ. එම පාසලෙහි 2012 වසරේ සිටි ළමුන් සංඛ්‍යාව කොපමණද?

ඇ. 2016 වර්ෂයේ ළමුන් සංඛ්‍යාව කොපමණද?

ඈ. 2015 වර්ෂයේ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි ළමුන් සංඛ්‍යාව කොපමණද?

i. එයින් සමත් සංඛ්‍යාව කොපමණද?
ii. වැඩිම ලකුණු කියද?
iii. අඩුම ලකුණු කියද?

ඉ. එසේනම් ශිෂ්‍යත්ව ලකුණු ප්‍රතිශතය අනුව පාසල සමස්ථ ශ්‍රී ලංකාවෙන්ම කුමන ස්ථානයේ පසුවන්නේද?

i. බස්නාහිර පළාතෙන් හිමි ස්ථානය කුමක්ද?
ii. කළුතර දිස්ත්‍රික්කයෙන් හිමි ස්ථානය කුමක්ද?
iii. හොරණ කලාපයෙන් හිමි ස්ථානය කුමක්ද?

ඊ. ප්‍රතිශතයක් ලෙස අධ්‍යාපන තත්වය උසස් මට්ටමක පවතින බව පෙන්නුම් කරන්නේ නම් එම පාසල කිසිදු ස්ථානයකදී හෝ ආයතනයකදී ඇගයීමකට ලක් නොකරන්නේ මන්ද?

උ. ප්‍රදේශයේ ජනප්‍රිය පාසලක් බවට පත්ව ඇති මෙම පාසලේ ගොඩනැගිලි අවශ්‍යතාවය පිළිබඳ ඔබතුමා කුමන පියවරක් ගන්නේද?

**03.** ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්‍ෂණ පිලිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /16/03)

අ. බස්නාහිර පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල කොපමණ ප්‍රමාණයක් තිබේද?

ආ. එම අධ්‍යාපන කලාප සඳහා 2016 වර්ෂයට අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කර තිබේද?

ඇ. එසේ පත් කර තිබේ නම් ඒ ඒ කලාප සඳහා පත් කර ඇති මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනයක් සභාගත කරන්නේද?

ඈ. කලාප කාර්යාලවලට අධීක්ෂණ මන්ත්‍රීවරුන් පත් කරන්නේ කුමන පදනමක් මතද?

ඉ. එසේ පත් කළ අධීක්ෂණ මන්ත්‍රීවරුන්ට පවරා ඇති කාර්ය භාරය කුමක්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප);

"බස්නාහිර පළාතේ 2015 අංක ........... දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය."

(දෙවනවර කියැවීම)

[ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියැවීම 2015.07.21 දින සිදුකර ඇත.]

## X . පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා**

"බස්නාහිර පළාත තුළ වතු ආශ්‍රිතව විශාල ජනතාවක් ජීවත් වන අතර, ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය යහපත් කිරීමේ සහ ඔවුන් මෙරට ආර්ථිකයේ ශක්තිමත් කොටස්කරුවන් බවට පත් කිරීමේ අරමුණෙන්, වතු පාසල් විශාල සංඛ්‍යාවක් පිහිටුවා ඇත. මෙම වතු පාසල්වල දරුවන්හට අධ්‍යාපනය නිසි පරිදි ලබාදීමට පහසුකම් රැසක් ස්ථාපිත කර ඇතත්, ඔවුන්ට අධ්‍යාපනය ලබාදෙන ගුරුවරුන්ට දුෂ්කරතා රැසකට මුහුණදීමට සිදුව ඇත.

එම ගුරුවරුන් පත්වන දුෂ්කරතාවයන් අතර පාසලට ළඟාවීමට ඇති ප්‍රවාහන අපහසුතාවය ප්‍රධානතම කරුණක් වන අතර, එයට විසඳුමක් ලෙස බස්නාහිර පළාතේ සේවය කරනු ලබන සියලු වතු පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරුවරුන්ට ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම සඳහා බස්නාහිර පළාත් සභාවේ මැදිහත්වීමෙන් යතුරු පැදියක් ලබාදීමට කටයුතු කිරීම සුදුසු' යැයි මෙම පළාත් සභාව අදහස් කරයි."

(යෝ/VI (1) /14/14)

**02. ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය:**

"විවිධ නම්, විවිධ වැඩසටහන් හඳුන්වා දෙමින් ක්‍රම ක්‍රමයෙන් ගම්බද පාසැල් වසා දැමීම මගින්, ගම තුළ අඩු ආදායම්ලාභී පවුල්වල ජන්ම ලාභී දක්ෂ දරුවන්ට, මනා පාසැල් අධ්‍යාපනයක් ලබා ගැනීමට ඇති අයිතිය අහිමි වෙමින් පවතී. ගම්බද පාසැල් වැසියාමෙන් වාහන මගින් දුරින් පිහිටි පාසැල් වලට යා නොහැකි ශිෂ්‍යයන් පාසැල් අධ්‍යාපනයෙන් සමුගන්නා ප්‍රවණතාවයක්ද දක්නට ඇත. එම හේතුවෙන් දෙමාපියන්ද දුෂ්කරතා රාශියකට මුහුණ දී ඇත. එහෙයින් ගම්බද පාසැල් සඳහා යලි පහසුකම් ලබා දී ගම්බද සිසුන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි"

(යෝ/VI (1) /15/01)

## XI . සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.01.20 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.